## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 09 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශණයක් මූල්‍ය ප්‍රකාශණ සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 03 අනුව ගිණුම් ඉදිරිපත් කිරීමේදී ගිණුම්වල අගයන් අවසාන රුපියලට පෙන්විය යුතු වුවත් ආදායම් හා වියදම් ගිණුම ඒ අනුව සකස්කර නොතිබුණි.

(ඇ) 2007 අංක 07 දරන සමාගම් පනත අනුව ඉකුත් වර්ෂවල ගිණුම් පිළියෙල කර තිබුණු නමුත්, 2012 මැයි 31 දින ඉදිරිපත් කළ සංශෝධිත ගිණුම නව ආකෘතියකට අනුව සකස්කර තිබුණු අතර, එය කුමන පදනමක් මත පිළියෙල කළේද යන්න හා එම වෙනස්වීම පිළිබදව හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 පරිදි සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ තොග භෞතික සත්‍යාපනය කර නොතිබුණු අතර, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකමින් අඩු වටිනාකම ගිණුම්වල සටහන් කළ යුතු වුවත් රු.2,315,953 ක් වූ පොත් වටිනාකම ගිනුම්වල සඳහන් කර තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදල් රැස්කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 03 න් ලැබී තිබුණු එකතුව රු. 419,861 ක් වූ ආදායම් අනුචිත ලෙස උපචිත වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) එකතුව රු.204,760 ක් වූ පුනරාවර්තන වියදම් ඉඩම් හා ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති මුදලින් 60% ක ප්‍රමාණයක් වන රු. 1,742,520 ක මුදල 2010 පෙබරවාරි 10 දින මණ්ඩලයට ලැබී තිබුණු අතර, එය අනුචිත ලෙස එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන -1995 ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගතකර තිබුණි.

### 1.2.4 අවිනිශ්චිත ගිණුම්

2005 වර්ෂයේ සිට ගිණුම්වල පෙන්වන රු.502,438 ක අවිනිශ්චිත ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.2,128,068 ක් වූ අත්තිකාරම් ශේෂය තුල වර්ෂ 10 ඉක්මවූ වටිනාකම රු.1,832,060 ක් වූ ශේෂ 17 ක්ද, එකතුව රු.1,335,034 ක් වූ ණයහිමියන් තුල වර්ෂ 07 ඉක්මවූ වටිනාකම රු.1,271,034 ක් වූ ශේෂ 46 ක් ද ඇතුළත් වී තිබණි.

(ආ) රු.2,128,068 ක් වූ අත්තිකාරම්, රු.5,730,039 ක් වූ ණයගැතියන් හා රු.1,335,034 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණු අතර, රු.1,831,733 ක් වූ මුදල් හා බැංකු ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් කැඳවා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ලබාදී එම වර්ෂයේ ගිණුම්වල වියදම් ලෙස ගලපා තිබුණු රු.162,000 ක් වූ අත්තිකාරම් 2012 ජුනි 06 දින දක්වාද නිරවුල් කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ පෙබරවාරි මස සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා ලබාදී තිබුණු එකතුව රු. 330,900 ක් වූ තත්කාර්ය අත්තිකාරම් 2012 ජුනි 06 දින දක්වාද

පියවා නොතිබුණු අතර එසේ පියවා නොතිබුණු කාලය මාස 03 සිට මාස 27 දක්වා පරාසයක විය.

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 13 (8) වගන්තිය | 13(7)(ඒ) වාර්තාවේ පෙන්වා ඇති කරුණු පිළිබඳව ගැනීමට යෝජිත පියවර එම වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කරන ලද දිනයේ සිට මාස 03 ක් ඇතුලත විගණකාධිපති වෙත දන්වා එවිය යුතු වුවත්, 2011 මාර්තු 30 දිනැති 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ 13(7)(ඒ) වාර්තාව පිළිබඳව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | (i) ii පරිච්ඡේදයේ 9.1 හා 9.1.1 | රජයේ විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හා අවුරුදු 60 සම්පූර්ණ කිරීමට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ හෝ සංස්ථාවක සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගතයුතු වුවත් ඊට පටහැනිව කොන්ත්‍රාත් පදනම යටතේ මධ්‍යස්ථාන කළමනාකරුවන් 4 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. |
| | (ii) vi පරිච්ඡේදයේ 2.10 | පත්වීම් හා ඒ සම්බන්ධ අනෙකුත් කරුණු පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| (ඇ) | රජයේ මුදල් රෙගුලාසි | |
| | (i) 395 (ආ) හා (ඇ) | එක් එක් මාසය අවසානයේ ඇති ගණුදෙනුවල තත්ත්වය සම්බන්ධයෙන් ඊලග මාසයේ 15 දිනට පෙර බැංකු සැසදුම් ප්‍රකාශයක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කලයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 454 | ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | (iii) 772 | 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ අනුව සිදුකළ යුතු ගාල්ල ශාඛාවේ අපහරණ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2009 | පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතාකර නොතිබුණි. |
| (ඉ) | 2009 ජුනි 01 දිනැති අංක 30(i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3 ඡේදය | 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක ශ්‍රේණි හැර අනෙකුත් ශ්‍රේණිවල වැටුප් වර්ධක අගයන් සංශෝධනය කළ යුතු වුවත් 2012 මාර්තු 16 දින දක්වාද සංශෝධනය කර නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංවිධාන සැලැස්මේ පිටපත් වාර්ෂික අයවැය ලේඛණයත් සමග සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයට ප්‍රථම අදාල අමාත්‍යාංශය, පොදු ව්‍යාපාර පිළිබද දෙපාර්තමේන්තුව, මහා |

භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.18,676,865 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු.14,873,999 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,802,866 ක පිරිහීමක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු.15,894,261 කින් වැඩිවී තිබුණද, පැවරුම් පදනම මත බඳවාගෙන තිබුණු කාර්ය මණ්ඩල වැටුප් රුපියල් මිලියන 11 කින්ද, ආරක්ෂක ගාස්තු, මධ්‍යස්ථාන බදු කුලී, වාහන නඩත්තු හා මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය රුපියල් මිලියන 1 බැගින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට බලපා තිබුණි.

### 2.3 අවිධිමත් ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකුට අදාල ආපදා මුදල් එකතුව රු.353,900 ක් සත්‍ය වශයෙන් ලැබී තිබියදී අදාල නිලධාරීන්ට මාස 5 ක් හා 8 ක් යනතුරු එම මුදල් ලබාදී නොතිබුණි.

(ආ) විදේශ ගමන්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

i. 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් සහ භාණ්ඩාගාර ලේකම්ගේ අංක මු.ක්‍ර.අ. 01/2010/01 චක්‍රලේඛයේ 03 වගන්තිය අනුව අධ්‍යාපන හෝ විදේශ පුහුණු සඳහා විදේශගතවීමේදී අනියම් දීමනාව ලෙස දිනකට ඇමරිකන් ඩොලර් 30 බැගින් උපරිම දින 30 ක් සඳහා

ගෙවිය හැකි බව සදහන් වී තිබුණද, මණ්ඩලයේ නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් එකතුව ඇමරිකන් ඩොලර් 260 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ii. චක්‍රලේඛයේ 9 වන වගන්තියේ (1) ඡේදයට අනුව දීමනා ගෙවීම් කරනු ලබන අවස්ථාවේදීම එය වියදමක් වශයෙන් ගිණුම්ගතකල යුතු නමුත්, 2011 වර්ෂයේ විදේශගතවූවන් වෙනුවෙන් කල එකතුව රු.125,543 ක් ක් වූ ගෙවීම් සමාලෝචිත වර්ෂය සඳහා 2012 මාර්තු දක්වාම ගිනුම් ගතකර නොතිබුණි.

**2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2010 මැයි 10දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් 2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන ප්‍රකාරව 2010 මැයි 04 වන දින සිට මණ්ඩලයට අනුබද්ධිතව පිහිටුවා තිබුණ 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරිය වෙත වෙනම භාණ්ඩාගාර ප්‍රදානයක් ලැබී නොතිබුණ අතර, මණ්ඩලයේ අරමුදල් මගින් සියළු වියදම් දරා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) පුරෝගාමී පාලන අධිකාරියේ සභාපතිවරයා ලෙස මණ්ඩලයේ සභාපතිවරයා අදාල ගැසට් පත්‍රයේ 2(1)හා 4 වගන්ති ප්‍රකාරව පත්වෙන අතර, එම ගැසට් පත්‍රයේ 3(1)(2) පරිදි එම අධිකාරිය මණ්ඩලය තුල පිහිටුවා තිබිය යුතු බවත්, එහි සියලු කර්තව්‍යයන් මණ්ඩලය මගින් සමායෝජනය කල යුතු බවත් සදහන් වුවද, මණ්ඩලයේ සභාපතිවරයාට අධිකාරිය මගින් සභාපති දීමනා ලෙස මසකට රු.25,000 බැගින් ගෙවා තිබුණි.

(ii) මණ්ඩලයේ අවසන් ගිණුම්වලට අධිකාරියේ ගිණුම් ඒකාබද්ධ කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සදහන් නිරීක්ෂණයන් කෙරේ.

සේවාලාභීන් පිළිබද විස්තර

(අ) මණ්ඩලයේ මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර මධ්‍යස්ථාන 5ක් පවත්වාගෙන යනු ලබන අතර සමාලෝචිත වර්ෂයේදී එම මධ්‍යස්ථානවලින් උපදේශක සේවා ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව 1849 ක්ද ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඇතුලත් වූ සේවා ලාභීන් සංඛ්‍යාව 1017 ක් ද විය. 2010 වර්ෂයේදී එය 2313 ක් විය.

(ආ) ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ සේවාලාභීන්ගෙන් 126 ක් හෙවත් 12.39% පැරණි සේවාලාභීන් විය. ප්‍රතිකාර සම්පූර්ණ කල සේවාලාභීන් සංඛ්‍යාව 316 ක් හෙවත් 31.07% ක් වූ අතර, එසේ ප්‍රතිකාර සම්පූර්ණ නොකර පිටවී ඇති සංඛ්‍යාව 591 ක් හෙවත් 58.11% විය.

(ඇ) එක් සේවාලාභියකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.76,044 ක පිරිවැයක් දරා තිබූ අතර එය 2010 වසරේදී රු.77,876 ක් විය.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව නවදිගන්තය හැරුණුවිට තලංගම, මහනුවර හා ගාල්ල සේවා මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන්ගේ සැලකිය යුතු අඩුවක් නිරීක්ෂණය වූ අතර සියළු මධ්‍යස්ථානවල නේවාසික ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1,296 ක් හෙවත් 56% කින් අඩු වී තිබුණි.

(ඉ) ඉදිරිපත්කළ තොරතුරු අනුව මණ්ඩලයේ ඉහතකී මධ්‍යස්ථානවල ඉඩ පහසුකම් තිබියදී, එකතුව රු.1,185,613 ක වාර්ෂික වියදමක් දරමින් සේවාලාභීන් 53දෙනකු වැනි ප්‍රමාණයක් වෙනුවෙන්, කොට්ටාවේ කුලියට ගත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම වෙනුවට, එම ඉඩ පහසුකම් ප්‍රයෝජනයට යොදවා ගැනීමට උත්සාහ කිරීම වඩාත් යෝග්‍ය බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) නවදිගන්තයමධ්‍යස්ථානය පිහිටි අක්කර 18 ක් වු බිමෙහි පොල් ගස් 769 ක් පමණ තිබුණු අතර ලබාතිබුණු පොල් ආදායම 2009 , 2010 හා 2011 වර්ෂ වලදී පිළිවෙලින් රු.649,279 ක් රු.886,907 ක් හා රු.999,291 ක් විය.

ඒ අනුවපසුගිය වර්ෂ දෙක හා සැසදීමේදී පොල් එලදාව ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර, ක්‍රමානුකුලව පොහොර යොදා නඩත්තු කිරීම තුලින් සරු එලදාවක් ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුව තිබුණි.

(ii) මණ්ඩලයේ නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කිරීම සඳහා බාහිර උපදේශකවරයකුගේ සහය ලබාගෙන ඒ වෙනුවෙන් රු.60,000 ක මුදලක් ගෙවා තිබුණි.

**3.3 ආර්ථික නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) මණ්ඩලයේ ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම වෙනුවෙන් 2011 ඔක්තෝබර් මස පුවත්පත් දෙකක දැන්වීම් පල කිරීම සඳහා 2011 දෙසැම්බර් මස රු.53,491 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම බඳවා ගැනීම පිළිබඳව කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අම්පාර, බේරුවල, කුරුණෑගල, අනුරාධපුර හා රත්නපුර යන දිස්ත්‍රික් කාර්යාල වෙනුවෙන් එකතුව රු. 870,000 ක් කුලී වශයෙන්ද, කුරුණෑගල කාර්යාලය සඳහා තිර රෙදි දැමීම වෙනුවෙන් රු. 28,298 ක්ද ගෙවා තිබුණු නමුත්, එම දිස්ත්‍රික් කාර්යාල 2012 වර්ෂයේදී ඉවත් කිරීමට කටයුතු කර ඇති බැවින් එම ගෙවීම් ඵලදායි නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

**3.4 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේ ජාතික ක්‍රීඩා අරමුදලින් හා පොලිසියෙන් ලද ප්‍රතිපාදනවලින් රු.10,191,349 ක් ගෙවා මිලදීගෙන තිබුණු ජී.සී.එම්.එස් පරීක්ෂණ යන්ත්‍රය (High Performance Capillary Gas Quadrupole Mass Spectrome ) අදාල පරීක්ෂණ වාර්තා සිදු නොකිරීම හේතුවෙන්, 2012 ජුනි මස 06 දින දක්වා ඌණ උපයොජිතව පැවතුණු අතර, ගාල්ල මධ්‍යස්ථානයේ නිදන ඇඳන් 7ක් , මෙට්ට 7ක් හා පුටු 28 ක් ද ඌණ උපයොජිතව පැවතුණි.

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 217 ක් වු අතර ස්ථිර කාර්ය මණ්ඩලය 111 ක් විය. ඊට අමතරව පැවරුම් පදනම මත 86 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඔවුන් වෙනුවෙන්

වැටුප් ලෙස එකතුව රු.13,431,054 ක මුදලක් ගෙවා තිබුණි. මේ සඳහා විධිමත් අනුමැතීන් ලබාගත් බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

**3.6** **වාහන උපයෝජනය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය සතුව යතුරුපැදිද ඇතුළුව වාහන 24 ක් පැවති අතර, ඉන් වාහන 3ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) වර්ෂය තුල රු.286,270 ක් නිශ්ක්‍රිය වාහන තුනෙහි අළුත්වැඩියා කටයුතු සඳහාද, රු.457,330 ක් 1987 මිලදී ගත් ජීප්රථයක එන්ජින් අළුත්වැඩියාව සඳහාද යොදවා තිබීම ආර්ථික නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණු වාහන 05ක් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනින් ලැබුණු වාහන 02ක් සමාලෝචිත වර්ෂය දක්වාම මණ්ඩලය යටතට පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

-----------------------------------------

**4.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

මණ්ඩලයේ ගිණුම් 2012 පෙබරවාරි 29 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණු අතර, 2012 අප්‍රේල් 25 දිනැති 14(2)(සී) කෙටුම්පත් වාර්තාව අනුව, මණ්ඩලයේ සංශෝධිත ගිණුම් 2012 මැයි 31 දින ඉදිරිපත් කෙරුණි.

**4.2** **සංයුක්ත සැලැස්ම**

-------------------

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී 12 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 හි සඳහන් පරිදි සැලැස්මේ අඩංගුවිය යුතු පහත සඳහන් කරුණු ඇතුලත් වී නොතිබුණි.

i. සංවිධාන සැලැස්ම.

ii. පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතඵල සමාලෝචනයක්.

**iii.** සමාලෝචිත වර්ෂය පිළිබඳ උපක්‍රමශීලී සැලසුම්.

**4.3 ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

සමාලොචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කොට තිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

-----------------------

මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර, අදාල අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබයි.

**4.5 විගණන හා කළමණාකරණ කමිටු**

-------------------------------------

2003 ජුනි 02 දිනැති පී.ඊ.ඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 අනුව , රැස්වීම් වාර 4ක් පැවැත්විය යුතු අතර, සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ රැස්වීම් 3ක් පවත්වා තිබුණි.

**4.6 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

මණ්ඩලයේ ප්‍රසම්පාදන සඳහා සැලැස්මක් සකස්කර නොතිබුණි.

**4.7 අයවැය ලේඛණමය පාලනය**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත විෂයයන් තථ්‍ය සංඛ්‍යාවන් සමග සැසඳීමේදී 10% සිට 103% දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛණය ඵලදායී කළමණාකරණ කාරකයක් ලෙස යොදාගත්බව නිරීක්ෂණය නොවීය.

**4.8 වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත්කිරීම**

----------------------------------------

මණ්ඩලයේ 2006 සිට 2009 දක්වා වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂයේදීද, 2010 වර්ෂයේ වාර්තාවේ ඉංග්‍රිසි පිටපත 2012 ජනවාරි මාසයේදීද, පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා අදාල අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිනිය වෙත දැනුම්දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කලයුතුවේ.

අ) ගිණුම්කරණය

ආ) මධ්‍යස්ථාන උපයෝජනය

ඇ) මූල්‍ය හා අභ්‍යන්තර පාලනය

ඈ) වත්කම් උපයෝජනය

ඉ) තොග පාලනය හා පොත්වල සටහන් තැබීම